සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2024-02-12

Learning Resource Centre R De Mazenod College Kandana

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
**Year End Evaluation - 2023 (2024)**

50424

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 යි |

නම / பெயர் / Name ..........................................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

සැලකිය යුතුය

- I කොටසේ ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

---

## I කොටස

- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. පාසලක ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයාගත හැකි මූලාශ්‍රය කුමක් ද?
   1. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ වයස් ව්‍යුහය.
   2. ගුරු භවතුන්ගේ නාම ලේඛනය.
   3. පාසල් කාල සටහන.
   4. පාසලේ විවිධ ස්ථානවල තිබෙන සමරු ඵලක.

02. ශ්‍රී ලංකාවේ ඖෂධවල වෙළඳ නාමය වෙනුවට ඖෂධීය නාමය භාවිත කළයුතු බවට අවධාරණය කළ තැනැත්තා වන්නේ,
   1. මහාචාර්ය ප්‍රේමදාස උඩගම මහතාය.
   2. ජේ. ආර්. ජයසූරිය මහතාය.
   3. මහාචාර්ය සේනක බිබිලේ මහතාය.
   4. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතාය.

03. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කීපයක් එක්වීමෙන් ගොඩනැගෙන පරිපාලන ඒකකය කුමක් ද?
   1. දිස්ත්‍රික්කය.
   2. පළාත.
   3. ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය.
   4. දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසය.

04. සම්පත් අපතේයාම වැළැක්වීම නිසා ඇතිවන වාසිය කුමක් ද?
   1. පරිසරයට සිදුවන හානි අවම වීම.
   2. මුදල් අපතේ යාමක් සිදු වේ.
   3. අනාගත පරපුරට පරිහරණයට සම්පත් ඉතිරි නොවේ.
   4. නූතන පරිසරය දූෂණය වේ.

05. අතිශය නාගරික පරිසරයක් සහිත බල ප්‍රදේශය හඳුන්වනු ලබන්නේ,
   1. සුළු නගර සභාව යනුවෙනි.
   2. නගර සභාව යනුවෙනි.
   3. මහ නගර සභාව යනුවෙනි.
   4. ප්‍රාදේශීය සභාව යනුවෙනි.

අංක 6 සිට 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. යම් පුද්ගලයකු ඔහුගේ පෞද්ගලික තොරතුරු ඇතුළත් කර සකස් කරන පත්‍රිකාව ජීව දත්ත පත්‍රිකාවයි (...........)

07. සැලසුම් සහගතව ක්‍රියාකරන ශිෂ්‍යයා ක්‍රමානුකූලව කටයුතු කරයි. (...........)

08. මිනිසාගේ බුද්ධිමය හැකියා හා කායික හැකියා දියුණු කර ගැනීමෙන් මානව සම්පතක් බවට පත්වේ. (...........)

09. අකාර්යක්ෂමව ක්‍රියා කිරීම අපට සේවා සපයන ආයතන වල යුතුකමකි. (...........)

10. සාරධර්ම වලට ගරු කිරීම විනය හා ශික්ෂණය සඳහා ප්‍රගුණ කළයුතු ගුණාංගයකි. (...........)

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වරහන තුළ දී ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

11. සැලසුම් සහගතව කටයුතු කරන ශිෂ්‍යයාට පහසුවෙන් ....................................... ජයගත හැක.
12. පොදු දේපල සුරැකීම නිසා ජනතාවට අත්‍යවශ්‍ය සේවා ....................................... සැපයීමට හැකිවේ.
13. කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක ....................................... පළාතට අයත්වේ.
14. අවමංගල්‍ය අවස්ථාවක මිනිසුන් ....................................... කටයුතු කරනු ලැබේ.
15. උප්පැන්න සහතිකයක් ලබා ගැනීමට ....................................... කාර්යාලයට යා යුතුය.

(යුතුකම්, අභියෝග, වයඹ, සාමූහිකව, කාර්යක්ෂමව, නිර්මාණාත්මකව, බස්නාහිර, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම්)

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට සුදුසු පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

16. ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක ගණන ............................. කි.
17. අපද්‍රව්‍ය ජලයට බැහැර කිරීම නිසා ජලය ............................. හේතුවේ.
18. ඔබේ ජීවිතයේ ............................. වැඩිදියුණු කරගතයුතු අතර දුබලතා අවම කරගත යුතුය.
19. පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබේ පාසලේ පවතින ............................. රැකගත යුතුය.
20. අප ප්‍රදේශයේ පවතින භෞතික ............................. ඵලදායීව භාවිත කරමු.

## II කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්නග
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනික් එක් එක් ප්‍රශ්ණයකට ලකුණු 11 බැගින් ද හිමි වේ.

01. i. ඔබ සතු හොඳ ගති ලක්‍ෂණ දෙකක් සඳහන් කරන්න.
    ii. පාසල් ලාංඡනය භාවිකරන අවස්ථා දෙකක් නම් කරන්න.
    iii. වයඹ පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක ලියා දක්වන්න.
    iv. හිරු එළියෙන් ලබාගන්නා ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.
    v. ඔබ ප්‍රදේශයේ පවතින සමිති වර්ග කර දැක්විය හැකි ආකාර දෙකක් නම් කරන්න.
    vi. විදුලිය අපතේ යෑම වැලැක්වීමට ඔබට දායක වියයුතු අවස්ථා දෙකක් ලියා දක්වන්න.
    vii. පොදු දේපල වල ලක්‍ෂණ දෙකක් සඳහන් කරන්න.
    viii. ඔබ සතු දක්ෂතාවක් හා දුබලතාවක් නම් කරන්න. (ලකුණු 2X8=16)

02. i. ඔබේ පාසල් සංස්කෘතියට අයත් අංග දෙකක් නම් කරන්න. (ලකුණු 2)
    ii. පාසල් අනන්‍යතාව පිලිබිඹුකරන සංකේත හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)
    iii. පාසල් කොඩිය භාවිත කරන අවස්ථා දෙකක් සඳහන් කර කොඩිය ඔසවන අවස්ථාවල ප්‍රදර්ශනය කළයුතු ඉරියව් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

03. i. ඔබ පාසල අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම හා අංකය ලියා දක්වන්න. (ලකුණු 2)
    ii. ඔබ ප්‍රදේශයේ ජීවත්වන මානව සම්පත් හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)
    iii. සාමූහිකව කටයුතු කිරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන පහක් ලියා දක්වන්න. (ලකුණු 5)

04. i. භෞතික පරිසරයට අයත් ස්වභාවික නිර්මාණ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 2)
    ii. ස්වභාවික පරිසරය තුළ කරන නිර්මාණ (නිර්මිත පරිසරය) හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)
    iii. යහපත් පුරවැසියෙකු ලෙස පරිසරය සුරැකීමට ගත හැකි ක්‍රිය මාර්ග දෙකක් සඳහන් කර එය ක්‍රියාත්මක කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

05. i. ඔබ ප්‍රදේශයේ ජනතාව පිහිටුවාගෙන තිබෙන සමිති දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
    ii. සිද්ධස්ථානයකින් සිදුවන සේවාවන් හතරක් නම් කරන්න. (ලකුණු 4)
    iii. පහත සඳහන් රාජ්‍ය සේවකයන්ගෙන් ගම්වාසීන්ට සිදුවන සේවාවක් ලියා දක්වන්න.
       A ග්‍රාම නිලධාරී
       B මහජන සෞඛ්‍ය පරීක්‍ෂක
       C සමෘද්ධි සංවර්ධන නිලධාරී
       D පවුල් සෞඛ්‍ය සේවිකාව
       E පොලිස් නිලධාරියා (ලකුණු 5)

06. i. පාසල් සංවිධාන ව්‍යුහය තුළ දැකිය හැකි සමිති දෙකක් නම් කරන්න. (ලකුණු 2)
    ii. පාසල් සිසුවකු ලෙස ඔබ සතු යුතුකම් හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)
    iii. ඔබ තුළ පවතින දුර්වලතා අවම කරගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග පහක් සඳහන් කරන්න. (ලකුණු 5)

07. i. ආචාරශීලී කථනයේ අංග ලක්‍ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 2)
    ii. සමාජයේ ක්‍රියාත්මක වන සරු දේවල් හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)
    iii. පහත සඳහන් පරිසර අංග දූෂණයට හේතුවන කරුණු එක බැගින් ලියා දක්වන්න. ඒවා කෙටියෙන් විස්තර කරන්න.
       A - ජලය B - ගොඩබිම (ලකුණු 5)